# ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් සහ මත්ද්‍රව්‍ය භාවිතය අත් නොහැරිමට බලපාන සාධක පිළිබඳ සමාජ මනෝ විද්‍යාත්මක අධ්‍යයනය

*වරුණිකා.ජී.එස්[1], ඩයස්.එම්.ආර්.පී[2], හචිංසන්.ඒ.ඕ[3], හේවාපත්තුආරච්චි.ටී,ඩී[4]

[1,2,3,4] මානව ශාස්ත්‍ර අධ්‍යයනාංශය, ඇක්වයිනාස් උසස් අධ්‍යාපන ආයතනය, ශ්‍රී ලංකාව
*shenaliwarunika12@gmail.com

## සංක්ෂිප්තය

***හැදින්වීම***

ලෝකය පුරා හදුනාගත හැකි ගැටලුවක් බවට මෙන් ම ආසියාවේ ප්‍රමුඛ ගැටලුවක් බවට මත්ද්‍රව්‍ය පත්ව ඇත (Herath & Ambekar.2017). සංවර්ධනය වෙමින් පවතින රටක් වන ශ්‍රී ලංකාව තුළ 1980 වර්ෂය වන තුරුම මත්ද්‍රව්‍ය සෞඛ්‍ය සහ සමාජ ප්‍රශ්නයක් බවට පත් වී නොතිබුණි ( Silva & Fonseka, 2008) එහෙත් අද වන විට ශ්‍රී ලංකාව පුරා සිසුයෙන් ව්‍යාප්ත වෙමින් පවතින මත්ද්‍රව්‍ය සමාජ ප්‍රශ්නයක් මෙන් ම සමාජ ප්‍රශ්න රැසක අනුබද්ධිත ප්‍රශ්නයක් බවට පත් වී ඇති ආකාරය හදුනාගත හැකි වේ. සමාජ සන්දර්භයේ පැවැත්මට අභියෝගයක් කරමින් මත්ද්‍රව්‍ය පරිභොජනය කරන ප්‍රමාණය සහ වෙනත් රටවලින් මෙරටට පැමිණ බෙදාහැරිමේ ක්‍රියාවලියේ කේන්ද්‍රිය රටක් වශයෙන් ද ශ්‍රී ලංකාව පත්ව ඇති අතර මෙලෙස දිනෙන් දින ඉහළ යන මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් ඇති වන ආර්ථික සහ සමාජ පිඩනයන් අවම කිරීම උදෙසා විශාල වියදමක් දැරීමට ශ්‍රී ලංකාවට සිදුව ඇත (Hewawaduge & Dorabawila .2015, සේනානායක, දර්ශන සහ වත්සලා.2015). ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය භාවිත කරන පිරිස් ව්‍යාප්ත වීම හදුනා ගැනීමේ දී මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් ඉහළ ප්‍රතිශතයක් සිටින ප්‍රදේශය ලෙස බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කය හදුනාගෙන ඇත. ශ්‍රී ලංකාවේ වයස අවුරුදු 18ට අඩු ජනගහනයෙන් ස්ත්‍රීන් 69 දෙනකු සහ පුරුෂයන් 6140 දෙනෙකු හෙරොයින් භාවිතකරන අතර වයස අවුරුදු 18 ට වැඩි ජනගහනයෙන් ස්ත්‍රීන් 1418 දෙනකු සහ පුරුෂයන් 84,913 දෙනෙකු හෙරොයින් භාවිත කරන අතර සමස්ථ හෙරොයින් භාවිත කරන පිරිස 92,540 ක් වේ. එසේම ශ්‍රී ලංකාවේ වයස අවුරුදු 18 ට අඩු ජනගහනයෙන් ස්ත්‍රීන් 246 දෙනකු සහ පුරුෂයන් 30,100 දෙනෙකු ගංජා භාවිත කරන ලද පිරිස වේ. එසේම වයස අවුරුදු 18 ට වැඩි ජනගහනයෙන් ස්ත්‍රීන් 4490 දෙනකු සහ පුරුෂයන් 267,062 දෙනෙකු ගංජා භාවිත කරන ලද අතර සමස්ථයක් ලෙස ගංජා භාවිත කරන පිරිස 301,898 ක් වේ. ( National Prevalence Survey on Drug Use 2019). එසෙම වර්තමානයේ ශ්‍රී ලංකාව තුළ අන්තරායකර ඖෂධ ලෙස ගැනෙන මත්ද්‍රව්‍ය අතුරින් හෙරොයින් සහ ගංජා වඩාත් ගැටලුකාරී මත්ද්‍රව්‍ය ලෙස සැලකිය හැකිය (සේනානායක, චනද්‍රදාස, වරාගොඩ සහ සංජීවනි. 2014). 2017 වර්ෂයට වඩා 2018 වර්ෂයේ හෙරොයින් භාවිතය නිසා අත් අඩංගුවට පත් පිරිස 22% වැඩි වී ඇති අතර හෙරොයින් භාවිත කරන පිරිස 2017 වර්ෂයට සිට 2018 වර්ෂය වන විට 40% කින් වර්ධනය වි ඇති ආකාරය හදුනාගත හැක. එසේම 2018 වර්ෂයේ ගංජා භාවිත කරන ලද වයස් කාණ්ඩය ලෙස 15-64 වයස් කාණ්ඩය නියොජනය කරන ජනගහණයෙන් ලක්ෂයකට පුද්ගලයන් 269 කි (Hand book of Drug Abuse Information, 2019). ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය භාවිත කරන පිරිස ඉන් මුදවා ගැනීමටත්, පෙළඹීමට වන හේතුන් අවම කර ගැනීමටත් රටෙහි ආර්ථිකයෙන් මුදල් යොදා ගැනීමට සිදුව ඇති අතර ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය භාවිත කරන පිරිස සඳහා රාජ්‍ය සහ රාජ්‍ය නොවන ප්‍රතිකාර හා පුනරුත්තාපන මධ්‍යස්ථාන මගින් පුනරුත්තාපන වැඩ සටහන් ක්‍රියාත්මක වේ (සේනානායක, චනද්‍රදාස, වරාගොඩ සහ සංජීවනි. 2014). එම තත්වය මත මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් මත්ද්‍රව්‍ය භාවිතය අත් නොහැරීමට බලපාන සාධක කවරක්ද යන්න අධ්‍යනය කිරීම වැදගත් වේ. මන් ද යත් කොතරම් වැඩ සටහන් ක්‍රියාත්මක උවත් තවදුරටත් මත්ද්‍රව්‍ය භාවිත කරන පිරිස ඉහළ යෑමෙන් අනාවරණය වන්නේ එම වැඩසටහන් හී අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගත නොහැකි වී ඇති බවයි. එවැනි වැඩ සටහන් සාර්ථක කරගැනීමට සහ මතින් තොර ශ්‍රී ලංකාවක් නිර්මාණය කරන ක්‍රියාවලියේ දී මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් මත්ද්‍රව්‍ය භාවිතය අත් නොහැරීමට බලපාන සාධක හදුනාගත යුතු ය. ඒ අනුව ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් මත්ද්‍රව්‍ය භාවිතය අත් නොහැරිමට බලපාන සාධක මොනවාද යන්න අධ්‍යයනය ප්‍රධාන අරමුණ කර ගනිමින්, ක්ෂේත්‍රය තුළ මත්ද්‍රව්‍යය භාවිත කරන්නන් මත්ද්‍රව්‍ය භාවිතය අත් නොහැරීමට සමාජ

සංස්ථාවේ බලපෑමක් පවතී ද යන්න අධ්‍යයනය කිරීම සහ මත්ද්‍රව්‍ය භාවිතය අත් නොහැරීමට ඔවුන්ගේ මානසික සාධකවල බලපෑම කෙබඳු ද යන්න අධ්‍යනය අනු අරමුණ කර ගනිමින් මෙම පර්යේෂණය සිදු කරන ලදී.

***පර්යේෂණ ක්‍රමවේදය***

අධ්‍යයනයේ ක්ෂේත්‍රය වශයෙන් උතුරු මැද පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ වෙන්නප්පුව ප්‍රදේශයේ ඇති මත් ද්‍රව්‍ය පුනුරුත්ථාපන කඳවුරක් වන "ඇල් ඇනෝ මිත්‍ර සමාජය" තෝරාගන්නා ලදි. එහිදී සරළ සසම්භාවි නියැදි ක්‍රමය මගින් දත්ත දායකයින් 25 දෙනෙකුගෙන් යුත් නියැදියක් තෝරා ගන්නා ලදී. දත්ත ලබා ගැනීමේදී ද්විතීයික දත්ත, ප්‍රාථමික දත්ත ක්‍රම යොදා ගත් අතර සම්මුඛ සාකච්ඡා හා ප්‍රශ්ණාවලි ක්‍රමය යොදා ගනිමින් ප්‍රාථමික දත්ත ලබාගන්නා ලදි. ද්විතීක දත්ත ලබා ගැනීමේ දී සංඛ්‍යා ලේඛන වාර්තාවන්, පොත් පත්, සඟරා, පුවත් පත්, ආයතනගත තොරතුරු සහ අන්තර්ජාලය මඟින් ලබා ගත් තොරතුරු උපයෝගී කරගන්නා ලදී. එලෙස ලබා ගත් ප්‍රාථමික දත්ත ගුණාත්මකව සහ ප්‍රමාණාත්මකව විශ්ලේෂණය කරමින් ප්‍රතිඵල ලබා ගන්නා ලදි. මෙම පර්යේෂණ සීමාවන් ලෙස අඩු කාල සීමාවක් තුළ අධ්‍යයනය සිදු කිරීමට සිදු වීම, ප්‍රතිකාරයන් සඳහා ස්ත්‍රීන් යොමු නොවීම හේතුවෙන් මෙම නියැදිය තුළ ස්ත්‍රී නියොජනයක් නොමැති වීම සහ ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය ලෙස සලකන ද්‍රව්‍යයන් අතරින් හෙරොයින් සහ ගංජා මත්ද්‍රව්‍ය භාවිත කරන්නන්ට මූලිකත්වය දෙන ලද නියැදියක් තොරාගැනීම පෙන්වා දිය හැක.

***ප්‍රතිඵල***

ජීව විද්‍යාත්මකව උපදින සත්වයකු සමාජීය සත්වයකු බවට පත් කරන ප්‍රධාන ක්‍රියාවලිය වන සමාජානුයොජන ක්‍රියාවලිය වන අතර පුද්ගල ජීවිතයේ සමාජ පැවැත්ම ක්‍රමවත්ව ගොඩ නැගිමට සමාජ සංස්ථා උපකාරිවේ. ජීව විද්‍යාත්මක අවශ්‍යතා සපුරාලන සමාජ සංස්ථා සමාජ සහ මනෝ විද්‍යාත්මක අවශ්‍යතා ද සපුරාලයි (ටෙනිසන, 2005, කුමාර 2008). මෙම අධ්‍යයනය දත්ත  අනුව ක්ෂේත්‍රය තුළ මත්ද්‍රව්‍යය භාවිත කරන්නන් මත්ද්‍රව්‍ය භාවිතය අත් නොහැරීමට සමාජ සංස්ථාවක් සහ සමාජානුයොජන අයතනයක් වන පවුල යන සංස්ථාවේ බලපෑමක් පවතී ද යන්න අධ්‍යයනය කිරීමේ දී දත්ත දායකයින් 80% ක් පෙන්වා දෙන ලද්දේ ඔවුන් පුනරුත්තාපනය වී ගිය පසු පවුල් සබදතාවන් හි යහපත් වෙනස් වීමක් දැකිය හැකි වූ බවයි. එසේම සමාජානුයොජනය කරන ප්‍රධාන කාරකයක් වන මිතුරු කණ්ඩායම් මත්ද්‍රව්‍යය භාවිත කරන්නන් මත්ද්‍රව්‍ය භාවිතය අත් නොහැරීමට බලපෑම් කරනවාද යන්න අධ්‍යයනය කළ අතර දත්ත දායකින් 76%ක් වූ බහුතර අදහස මත්ද්‍රව්‍ය අත් නොහැරිමට මිතුරන් බලපෑම් කරන බවයි. 68% පුනරුත්තාපනය වී ගිය පසු මිතුරු සබඳතා වෙනස් වූ බවත් 36% පුනරුත්තාපනයෙන් පසුත් ප්‍රථමයෙන්ම මිතුරන් ගෙනත් දෙන ලද මත්ද්‍රව්‍ය තුළින් නැවත මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වූ බව පෙන්වා දී ඇත. එසේම සමාජයේ ජීවියකු වශයෙන් සමාජ ව්‍යුහයේ සැකැස්ම මත ද එනම් පවතින ජනපිය සංස්කෘතිය හේතුවෙන් මත්ද්‍රව්‍යය භාවිත අවශ්‍ය බව  දත්ත දායකයින් 12% පෙන්වා දෙන ලදී.

මෙම අධ්‍යයනයට අනුව  මත්ද්‍රව්‍ය භාවිතය අත් නොහැරීමට මානසික සාධකවල බලපෑම කෙබඳු ද යන්න හදුනාගැනීමේ දී දත්ත දායකයින් මත්ද්‍රව්‍ය භාවිතය අත් නොහැරීමට ප්‍රධාන හේතු සාධකය වශයෙන් එනම් 56% වූ බහුතරය පෙන්වා දෙන්නේ දිර්ඝ කාලීන ඇබ්බැහිවීම මත මත්ද්‍රව්‍ය අත්හැරිම අපහසු දෙයක් බවයි. එනම් ඔවුන්ගේ ආකල්ප නිර්මාණය වී ඇත්තේ ඔවුන්ට  මත්ද්‍රව්‍ය භාවිතය අත් හැරීමට නොහැකි බවටයි. එසේම මත්ද්‍රව්‍ය අත් හැරිය හොත් සමාජයෙන් කොන්කරන ප්‍රජාවක් බවට ඔවුන් පත්වන බවට ආකල්පයන් ඔවුන් තුළ නිර්මාණය වී ඇත. ඒ බව දත්ත දායකින් 24% සිය සමාජයෙන් කොන්වීමට පවතින බිය නිසා මත්ද්‍රව්‍ය වලින් ඈත් නොවන බව පෙන්වා දීම තුළින් පෙන්වා දිය හැක.

පුද්ගලයන් මත්ද්‍රව්‍ය භාවිත කිරීමට වන අභිප්‍රේරණ සාධක  හදුනා ගැනීමේ දී පහත කරුණු අනාවරණය විය. එනම් දත්ත දායකයින් පෙන්වා දෙන්නේ මත්ද්‍රව්‍ය තුළින් සතුට (40%), සෑම ප්‍රශ්නයක් විසඳා ගැනීමට උදව්වීම (36%), ලිංගික ජීවිතයේ තෘප්තියට සහ පවතින සමාජ රැල්ලට අවශ්‍ය වීම (24%) වැනි හේතු මත ඔවුන් තව දුරටත් මත්ද්‍රව්‍ය සමඟ ජීවත් වීමට පොළඹවන බවයි. එසේම නියැදියේ 32% පෙන්වා දී ඇත්තේ මත්ද්‍රව්‍ය අත්හැරිය විට හුදකලා බව, පාළුව වැනි හැගිම් උත්පාදනය වන බවයි. එම

පෙළඹ වීම් මත තමා විසින්ම (60%) පුනරුත්තාපනයෙන් පසු නැවත මත්ද්‍රව්‍ය සොයාගෙන යන ලද බව ප්‍රකාශ කරයි. මෙම නියැදියේ දත්ත දායකින් (100%) සියලූ දෙනා මත්ද්‍රව්‍ය භාවිතයෙන් මිදීමට පූර්ණ අවශ්‍යතාවක් පවතින බව පෙන්වා දී ඇත.

***නිගමන***

ඒ අනුව පුද්ගලයන් මත්ද්‍රව්‍ය වලට හුරුවීමත් සමඟ එයින් මිදීමට 100%ක පූර්ණ අවශ්‍යතාවක් පැවතී. මත් ද්‍රව්‍ය භාවිත කරන්නන් මත් ද්‍රව්‍ය වලින් ඇත් වීම වළක්වාලීම සඳහා මිතුරු කණ්ඩායම්, ජනප්‍රිය සංස්කෘතික තත්වය, සමාජයේ කොන්වීමට ලක්වේ යන බිය පුද්ගලයන් මත් ද්‍රව්‍ය වලින් ඇත් වැනි සමාජ සාධක හේතු වී ඇත. සමාජයත් සමඟ කටයුතු කිරීමේ දී ඇති වන සමාජයේ කොන්වීමට ලක්වේ යන බිය, මත් ද්‍රව්‍ය තුළින් ලැබෙන සතුට වැනි චිත්තවේග, මෙන්ම ඒම චිත්තවේග තුළින් ගොඩනගා ගත් ආකල්ප සහ සතුට, සෑම ප්‍රශ්නයක් විසඳා ගැනීමට උදව්වීම, ලිංගික ජීවිතයේ තෘප්තියට සහ පවතින සමාජ රැල්ලට අවශ්‍ය වීම වැනි අභිප්‍රේරණ සාධක පුද්ගලයන් මත් ද්‍රව්‍ය වලින් ඇත් වීම වළක්වාලයි. සමාජ සහ මනෝමය සාධක සුවිශේෂී ක්‍රියාවලියක් බවට පත් වීම තුළින් පුද්ගලයන් මත් ද්‍රව්‍යවලින් ඇත් වීම වළක්වන බව දැකිය හැක.

***ප්‍රවේශ පද:*** *ශ්‍රී ලංකාව ,මත් ද්‍රව්‍ය, මත් ද්‍රව්‍ය භාවිත කරන්නන්, බලපාන සාධක*

**මූලාශ්‍ර**


2019. *Hand book of Drug Abuse Information*. National Dangerous Drugs Control Board, NDDCB, Sri Lanka.

2019. *National Prevalence Survey on Drug Use* . National Dangerous Drugs Control Board, NDDCB, Sri Lanka.

Herath.S & Ambekar.A .(2017). "*Rapid Assessment of Drug Use Patterns (RADUP) among People Who Use and/or Inject Drugs (PWUD/PWID) in Sri Lanka"*. National STD/AIDS Control Program, (NSACP) and National Dangerous Drugs Control Board, NDDCB, Sri Lanka.

De Silva.P.V & Fonseka.P.(2008). *"Drug addicts and their behaviour related to drug addiction among the institutionalized addicts of the Galle District".* Galle Medical Journal, Vol 13: No. 1

Hewawaduge.S. & Dorabawila.S.(2015). "Economic Consequences of Drug Abuse in Sri Lanka". Peradeniya Economics Research Symposium 2015. University of Peradeniya , Sri Lanka.

පෙරේරාල ටෙනිසන්. (2005). *සමාජ විද්‍යාව.* කඩවත,නුවණී ප්‍රින්ටර්ස් ඇන්ඩ් පබ්ලිසර්ස.

කුමාර, එච්. එන්. වී. ජී. ඒ. 2008. "සමාජ විද්‍යාවඃ මූලික සංකල්ප, න්‍යාය හා ක්‍රමවේදය." පුංචි බොරැල්ල. විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය.

සේනානායක.බී., දර්ශන.ටී. සහ වත්සලා. එච්. (2015). *ශ්‍රී ලංකාවේ මතද්‍රව්‍ය පවාහනය, ජාවාරම් කිරීම සහ ජාවාරම්කරුවන පිළිබඳ කඩිනම් සමීක්ෂණය (බන්ධනාගාර ඇසුරින්).* ශ්‍රී ලංකාවේ මතද්‍රව්‍ය දූර්භාවිතය පළිබඳ පර්යෙෂණ ලිපි එකතුව ( IV වන කොටස), හඳානි සේනානායක සහ දිල්හාරා වරාගොඩ. පර්යේෂණ අංශය .අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය. රාජගිරිය.

සේනානායක. බි, චනද්‍රදාස. කේ, වරාගොඩ. ඩි සහ සංජීවනි.එන්. (2014). *ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානවලින් බැහැර වූ සේවාලාභීන් හා ප්‍රතකිාර ක්‍රියාවලිය පිළිබඳ තක්සේරු අධ්‍යයනය.* ශ්‍රී ලංකාවේ මතද්‍රව්‍ය දූර්භාවිතය පළිබඳ පර්යෙෂණ ලිපි එකතුව ( IV වන කොටස), හඳානි සේනානායක සහ දිල්හාරා වරාගොඩ. පර්යේෂණ අංශය .අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය. රාජගිරිය.